# ජනසන්නිවේදන මාධ්‍යයන් (DECREE ON THE MEDIA OF SOCIAL COMMUNICATIONS - *INTER MIRIFICA*) පිළිබඳ දෙවන වතිකාන මන්ත්‍රණ සභා නියෝගයː ඉතිහාස අධ්‍යයන ගවේෂණයක්

එස්. එස්. එන්. වික්‍රම

බටහිර සම්භාව්‍ය සංස්කෘතික හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය

ජනසන්නිවේදන මාධ්‍යයන්ට අදාළ දෙවන වතිකාන මන්ත්‍රණ සභා නියෝග පිළිබඳ ඉතිහාසය ගවේෂණය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ යි. මෙහි දී ප්‍රථම වරට සභාව ජනසන්නිවේදන මාධ්‍යයන් කෙරෙහි දැක්වූ සභා ආකල්පය, අධ්‍යයනය සහ නියෝගය පිළිබඳ ඓතිහාසික පසුබිම මෙන් ම සභාවෙහි ශුභාරංචි ප්‍රකාශනයට මාධ්‍ය උපයෝගි කර ගත හැකි අවස්ථා විදර්ශනය කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

මන්ත්‍රණ සභාවෙහි සාකච්ඡාවට බඳුන් වූ සෙසු යෝජනා සමඟ සසඳන විට මෙම නියෝගය අවම කාල පරාසයක් තුළ දීර්ඝ කාලීනව විචාරාත්මක අධ්‍යයනයකට ලක් නොවූ යෝජනාවලියකි. දර්ශනය, දේවධර්මය මෙන් ම නීතිය යන විෂය පද්ධතීන්ගෙන් බැහැර වීම, සභාව ශුභාරංචි ප්‍රකාශනයට මාධ්‍ය යොදා ගැනීමේ දී ඇති වන ගැටලු තත්ත්වයන් නොසලකා හැරීම සහ නූතන මාධ්‍යයන් පිළිබඳ අවධානය යොමු නොවී තිබීම මෙහි පර්යේෂණ ගැටලු වේ.

**ජනසන්නිවේදන මාධ්‍යයන් පිළිබඳ මෙම නියෝගය** ඉතිහාස අධ්‍යයනයකට යොමු කිරීම වැදගත් වන්නේ මන්ත්‍රණ සභාව පවත්වා වසර පනහක පමණ දීර්ඝ කාල පරිච්ඡේදයක් තුළ විධිමත් අධ්‍යයනයක් ඒ පිළිබඳ සිදු නොවූ හෙයිනි.

මෙම නිබන්ධයට අදාළ දත්ත රැස් කර ගැනීම සඳහා යොදා ගත් පර්යේෂණ ක්‍රමවේද ලේඛන, ඓතිහාසික හා මූලාශ්‍රය විමර්ශනයන් දැක්විය හැකි වේ. ජී. ඇල්බෙරිගෝ (G. Alberigo) විසින් සම්පාදිත *History of Vatican II* නමැති ග්‍රන්ථ වෙළුම් පහට අමතරව විශ්වකෝෂ, ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ලිපි, අන්තර්ජාලය ආශ්‍රයෙන් ද දත්ත ගොනු කොට තිබේ.

**මූලික පදː** ජනසන්නිවේදන මාධ්‍යයන්, දෙවන වතිකාන මන්ත්‍රණ සභාව, යෝජනාවලිය